# මිතුරියගේ මැජික් දොර



තිනුරි ලෝහිත්‍යා රත්නායක

කතෘගේ නම: තිනුරි ලෝහිත්‍යා රත්නායක

කෘතියේ නම ඃ මිතුරියගේ මැජික් දොර

කතෘ අයිතියඃ ISBN 978-624-208-805-1

පිටකවර සිතුවම සහ අනෙක් සිතුවම් (තාක්ෂණික සහායෙන්) :

තිනුරි ලෝහිත්‍යා රත්නායක,

5 E, මහාමායා බලිකා විද්‍යාලය ,

මහනුවර.

පොත පරිගණක සැකසුමඃ රසික රත්නායක ගුරුතුමා,
ධර්මරාජ විද්‍යාලය,

මහනුවර

කෘතිය එල කරන දිනයඃ 2025/01/22

**පිදුම**

ආදරයෙන් මා හැදූ ආදරණීය **දෙමවුපියන්ටත්**

පොත් ලිවීමට මා යොමු කළ මහාමායාවේ **සමන්මලී හෙට්ටිආරච්චි** ආදරණීය ගුරුතුමියන්ටත්

මාගේ මේ පළමු පොත උපහාරයක්ම වේවා

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි. ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන හෙරණගත්කරණී ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය. මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

එක්තරා ලස්සන ගම්මානයක

මෙතුකි නමින් දැරියක් හිටියා . මෙතුකි සෙල්ලමටම බර ළමයෙකු  වූ නමුත් ඇය කවදාවත් ඉගෙනීමට කැමති වූනේ නෑ.

ඇය බොහෝ විට ගෙදර වැඩ අතපසු කළා. පන්තියට පොත් ගෙන ඒමට අමතක කළා.

සමහර විට ඉගෙනීමට උත්සාහ කරන ළමයින්ට විහිළු කළා.

දවසක් නුවනි කියලා අලුත් ළමයෙක් මෙතුකිගේ පන්තියට එකතු වුණා .

ඇය කරුණාවන්ත, ඉවසිලිවන්ත විතරක් නෙවෙයි අන් අයට උදව් කිරීමට නිතරම ලෑස්තියි .

ඇය ඉගෙනීමට ආස කළා. ඇය දන්නා දේ ඇගේ මිතුරන් සමඟ බෙදා ගත්තා.



මුලදී මෙතුකිට නම් නුවනිව අමුතු කෙනෙක් වගේ පෙනුණා .

“ඇයි ඔච්චර ඉගෙන ගන්නේ? එපා වෙන්නෙ නැද්ද? ” ඇය කීවා.

ඒත් නුවනි හිනාවෙලා උත්තර දුන්නා, “ඉගෙනීම මැජික් දොරක් වගේ. ඔයා ඒක විවෘත කළොත් ඔබට අපූරු දේවල් සොයා ගන්න පුළුවන් කියලා මගේ අප්පච්චි මට කියලා දීලා තියෙනවා”

මෙතුකි සමච්චලයට හිනා වුණා.

දිනක් ගුරුතුමා කිවුවා “මෙච්චර දවස් උගන්නපු දේවල් වලින් මම දැනුම මිනුම තරගයක් තියනවා, ඔයාලා හැමෝම ලෑස්ති වෙන්න.” කියලා .

මෙතුකිට බය හිතුනා.ඒ ඇය පොඩ්ඩක් වත් පාඩම් කරලා නැති නිසා.

නුවනි එය දැකලා දුක හිතිලා , “අපි එකට පාඩම් කරමු. මට පුළුවන් ඔයාට දේවල් මතක තියගන්න පුළුවන් ලේසි ක්‍රම කියලා දෙන්න”කියලා කිවුවා.

මෙතුකි පසුබට වුණත් නුවනිගේ කාරුණික වචන ඇයට සහනයක් වුණා.

ඉතින්, ඔවුන් විශාල අඹ ගසක් යට වාඩි වූ අතර, නුවනි ඇයට විනෝදජනක කථා, පින්තූර සහ සරල උපක්‍රම භාවිතා කරමින් ඉගැන්වූවා. පළමු වතාවට මෙතුකි ඉගෙනීමෙන් සතුටක් ලැබුවා.



දැනුම මිනුම තරගය උදා වුණා. මෙතුකිත් උපරිම උත්සාහ කළාය. ඇය පුදුමයට පත් කරමින්, ඇය හොඳම ලකුණු ලබා ගත්තා.

"මම දිනුවා, මම දිනුවා" ඇය සතුටින් කෑගැසුවාය.

නුවනි අත්පුඩි ගසමින්, "ජේනව නේද? ඔයා දක්ෂයි, මෙතුකි. ඉගෙනීම තමයි ඔයාට දිනුම ලබා දෙන මැජික් දොර. " කියලා කිවුවා.



එදා ඉඳන් මෙතුකි වෙනස්ම ළමයෙක් වුණා. ඇය පාඩම් කළා, අන් අයට උදව් කළා, පන්තියේ දක්ෂම ළමයින්ගෙන් කෙනෙක් වුණා. ඒ වගේම මේ හැම දෙයක්ම සිද්ද වුණේ එක කරුණාවන්ත මිතුරියක් නිසා. ඒ නුවනි.

ඉතින් කරුණාවේ සහ මිත්‍රත්වයේ මායාව මෙතුකිව හොඳ දක්ෂ දරුවෙක් බවට පත් කළා.

# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි. මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදූහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය. මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට  එක්වීමත් සමඟ දරුවන් එයින් දූරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලූ ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම්  වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව  තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේකම්